

# චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ
# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

**2023-06-07**

| දේශාංශ நெட்டாங்கு | | | අක්ෂාංශ அகலாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 79 | 46 | E | 4 | 44 | N | 32 |
| 77 | 45 | E | 5 | 10 | N | 26 |
| 67 | 19 | E | 5 | 28 | S | 31 |
| 80 | 17 | E | -2 | 36 | S | 37 |
| 81 | 25 | E | -3 | 34 | S | 34 |
| 85 | 39 | E | -4 | 34 | S | 37 |

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

**බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය**
**උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා**
**(2023 ජූනි මස 07 දින පෙ.ව. 07.00 ට, ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළගේ වේගය **පැ.කි.මී. (25-35)** පමණ වේ. පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා සහ හම්බන්තොට සිට පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (50-60)** පමණ දක්වා වැඩි විය හැක.
පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (40-50)** පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා සහ හම්බන්තොට සිට පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

**කාලගුණික තත්ත්වය:**
10N-17N,87E-100E : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**
05N - 20N, 80E-100E : නිරිත දෙසින් /පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. (50-60) දක්වා
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් /පැ.කි.මී. (20-40).

**මුහුදේ ස්වභාවය:**
05N - 20N, 80E-100E : තරමක් රළු දක්වා, විටින් විට රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

අරාබි මුහුද

**ගිනිකොනදිග අරාබි මුහුදේ පැවති පීඩන අවපාතය සුළිකුණාටුවක් (BIPARJOY) දක්වා වර්ධනය වී ජුනි 6දින පැය 20.30වනවිට උතුරු අක්ෂාංශ 12.3ත් නැගෙනහිර දේශාංශ 66.0ත් ආශ්‍රිතව ස්ථානගතව පැවතිණ. මෙම සුළිකුණාටුව ඉදිරි පැය 24 තුළ උතුරට දෙසට ගමන් කර නැගෙනහිර මධ්‍යම අරාබි මුහුද ආශ්‍රිතව චණ්ඩ සුළිකුණාටුවක් දක්වා වර්ධනය වීමට ඉඩ ඇත.**

- **උතුරු අක්ෂාංශ 07 - 17 ත් අතර සහ නැගෙනහිර දේශාංශ 60 - 70 ත් අතර මුහුදු ප්‍රදේශයට නැවත දැනුම් දෙනතුරු යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

**කාලගුණික තත්ත්වය:**
08N-15N, 60E-80E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**
07N-15N, 60E-70E : වාමාවර්තව භ්‍රමණය වේ / පැ.කි.මී. (40-50); විටින් විට පැ.කි.මී. (60-70) දක්වා.
05N-15N, 70E-80E : නිරිත දෙසින්/ පැ.කි.මී. (20-40) ); විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් / පැ.කි.මී. (20-40).

**මුහුදේ ස්වභාවය**
07N-15N, 60E-70E : රළු, විටින් විට ඉතා රළු.
05N-15N, 70E-80E : තරමක් රළු, විටින් විට රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

**<u>දකුණු ඉන්දියානු සාගරය</u>**

කාලගුණික තත්ත්වය:
EQ-10S, 60E-100E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**
05S-10S, 60E-100E : ගිනිකොණ දෙසින් / පැ.කි.මී. (20-40) ); විටින් විට පැ.කි.මී. (45-50) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : ගිනිකොණ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (20-40).

**මුහුදේ ස්වභාවය:**
05S-10S, 60E-100E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

****ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**



කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව